# කළමනාකරණ සහකාර (පරිගණක) තනතුරට බඳවා ගැනීම

## සී/ස දූනාගහ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය

අප සමිතියේ දැනට පුරප්පාඩුව පවතින කළමනාකරණ සහකාර (පරිගණක) තනතුර සඳහා සුදුසු අයෙකු බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ. මූලික සුදුසුකම් සපුරා ඇති අයගේ අයදුම්පත් සියලු සහතික වල පිටපත් සමග 2023.02.25 දිනට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කරන්න.

සමුපකාර සේවයේ නියුතු අය තම සමිතිය මගින් අයදුම්පත් එවිය යුතුය.

**104-09 වැටුප් පරිමාණයේ III ශ්‍රේණියේ කළමනාකරණ සහකාර (පරිගණක)**

**සුදුසුකම්**

(අ) 105-10 වැ.ප. වසර පහක හෝ 105-11 වැ.ප. වසර අටක් අදාල ක්ෂේත්‍රයේ ස්ථිර තනතුරක පළපුරුද්ද සහ පිළිගත් ආයතනයක වසරකට නොඅඩු පාඨමාලාවක් හෝ ඩිප්ලෝමාවක් සමත්වී තිබීම.

හෝ

(ආ) ගණිතය හා සිංහල භාෂාව ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සහිතව අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් සමත්වීම. (ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මානයක් ලබා තිබීම අමතර සුදුසුකමකි) සහ පරිගණක දත්ත ක්‍රියාකරණය පිළිබඳව රජයේ ලියාපදිංචි ආයතනයකින් ලබාගත් මාස හයකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත පාඨමාලාවක් සමත්ව තිබීම.

**සැ.යු.**

- තෝරාගන්නා අවස්ථාවේදී ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.
- පරිගණක මගින් සිංහල ලිපි සැකසීමට හැකියාව තිබීම අමතර සුදුසුකමකි.

(ඇ) වයස අවුරුදු 18-45 අතර වීම. සමුපකාර සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයට උපරිම වයස අදාළ නොවේ.

(ඇ) වැටුප් පරිමාණය - 21,284 - 575X10 - 675X10- 800X10 - 41,784/=

ආරම්භක මූලික වැටුප රු. 21,284/= ක් වන අතර, එයට අමතරව 15% ක දීමනාව සහ රු. 2,500/= ක දීමනාවද හිමිවේ.

(ඉ) ගම්පහ දිස්ත්‍රික්කය තුළ වසර දෙකකට වැඩි ස්ථිර පදිංචියක් තිබිය යුතුය.

සේවයට බඳවා ගන්නා අය සේවක අර්ථසාධක අරමුදලට හා සමුපකාර සේවක විශ්‍රාම වැටුපටද දායක විය යුතුය. සේවා නියුක්තයින්ගේ භාරකාර අරමුදලේ දායකත්වයද ඔබට හිමි වේ.

**සභාපති,**
**සී/ස දූනාගහ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය, දූනාගහ.**
**දුරකථන අංක : 031-2246564, 031-2243801**
**2023.02.15**